# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1688/21 – 2011 ජනවාරි 13 වැනි බ්‍රහස්පතින්දා – 2011.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: වෙන්/ප්‍රාලේ/ඉඅත්/95/11.

පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් එස්. එන්. බී. ඒ. කේ. එම්. එන්. ඩී. නාමරත්න වන මා විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 33 වන වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම් අත්කර ගැනීම සඳහා නියමිත වන්දි මුදල වන රුපියල් අටලක්ෂ පනස් එක්දහස් හත්සිය එකයි ශත හැත්තෑ එකක් (රු. 8,51,701.71) අයිතිකරුවන්ට ලබාගැනීම පිණිස මාරවිල දිස්ත්‍රික් අධිකරණයේ නඩු අංක 1624/එල් සිට 1653/එල් යටතේ බැරකර ඇති බව මෙයින් දන්වමි.

එස්. එන්. බී. ඒ. කේ. එම්. එන්. ඩී. නාමරත්න,
ප්‍රාදේශීය ලේකම්,
වෙන්නප්පුව.

2010 දෙසැම්බර් මස 24 වැනි දින,
වෙන්නප්පුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

ඉඩමේ නම: පැලියගොඩ – පුත්තලම මාර්ගය දෙපස පිහිටි ඉඩම්:

පිඹුරු අංක: මු.පි.පු. 3788හි කට්ටි අංක 11, 15, 20 1/2, 22 1/2, 22 2/2, 23, 33, 35 හා 62, මු.පි.පු. 3778හි කැබලි අංක 8, 9, 15 සහ 20, මු.පි.පු. 3753හි කැබලි අංක 15, 16, 18, 32, 33 හා 39, මු.පි.පු. 3745හි කැබලි අංක 27, 38, 56, 58, 63, 66, 68, 71, 80, 101, 108, 111 සහ 119, මු.පි.පු. 3791හි කැබලි අංක 47 සහ 48; ප්‍රමාණය: –

පිහිටීම: පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු උල්හිටියාව, මැද උල්හිටියාව, දකුණු උල්හිටියාව, මැද දුම්මලදෙණිය, දකුණු දුම්මලදෙණිය, මැද නයිනමඩම, බටහිර නයිනමඩම, රංගම්මමුල්ල, අංගම්පිටිය, නැගෙනහිර නයිනමඩම, හණතොටුපළ, නැගෙනහිර දුම්මලදෙණිය, උතුරු දුම්මලදෙණිය, දකුණු වෙන්නප්පුව, බටහිර වෙන්නප්පුව හා මැද වෙන්නප්පුව යන ග්‍රාම නිලධාරි වසම් තුළ පිහිටි පැලියගොඩ - පුත්තලම මාර්ගයේ දෙපස පිහිටි ඉඩම් කොටස්.

01 - 595